# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

**No:** 24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** +94 11 2565304 – 6, 5552746, 5552749, **Fax:** +94 114714460
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org


**උතුරු පළාත් සභා මැතිවරණය 2013**

**2013 සැප්තැම්බර් 21**

**දහවල් 12.00**

මැතිවරණය දින පෙරවරු 7 ට ඡන්දය ප්‍රකාශ කිරීම ඇරඹුණු මොහොතේ පටන් පහර දීමක් ද ඇතුළුව ඡන්ද දායකයන් බිය වැද්දවීම, ඡන්ද මධ්‍යස්ථාන අසල සිට ප්‍රචාරණ කටයුතුවල නිරත වීම, ඡන්දය දැමීමට එන පිරිස අතර ආහාර ද්‍රව්‍ය බෙදා දීම වැනි සිදුවීම් පිළිබඳ පැමිණිලි ගණනාවක් අප වෙත ලැබුණි. දහවල් 12 වන විට යාපනය දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල ඡන්දය ප්‍රකාශ කිරීමට ඡන්ද දායකයන්ගේ පැමිණීම සාමාන්‍ය මට්ටමක විය. කෙසේ වෙතත් මුලතිවු දිස්ත්‍රික්කය ඇතුළු අනික් ප්‍රදේශවල ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රතිශතය පහළ මට්ටමමක තිබූ බවට මැ.ප්‍ර.නි.ම ට වාර්තා ලැබුණි. මේ ප්‍රදේශවල ඡන්දදායකයන්ට තම ඡන්ද මධ්‍යස්ථානය වෙත ළඟාවීමට ඇතැම් විට කිලෝමීටර් 22 ක් පමණ දුරක් පැමිණීමට සිදුවී තිබුණි. මැ. ප්‍ර. නි. ම මේ පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාට දන්වූ අතර අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපයන බවට ඔහු සහතික කළේය. එසේ වුවත් දහවල් 12 වන විටත් සපයා තිබූ ප්‍රවාහන පහසුකම් ඉතා සීමිත විය. නැතිනම් එවැනි පහසුකමක් ලබා දී තිබුණේම නැත. වාර්තා වන ආකාරයට එක්සත් ජනතා නිදහස් සන්ධාන දේශපාලකයන් සහ හමුදාව විසින් ඡන්ද දායකයන්ව බිය වැද්දවීම් සිදුවූ තැන්වල ඡන්ද දායකයන් අතර භීතිය පැතිරී ගොස් තිබුණි.

මැතිවරණ දිනය වූ සැප්තැම්බර් 21 දින මැ. ප්‍ර. නි. ම ඡන්ද මධ්‍යස්ථාන වෙත ඡන්ද නිරීක්ෂකයන් . 240 ක් යැවූවේය. තවත් ක්ෂේත්‍ර නිරීක්ෂකයන් 17 ක් සහ ජංගම ඒකක 8 ක් නිරීක්ෂණ කටයුතු වල නිරත වී සිටිති. මැ. ප්‍ර. නි. මයේ සියළුම වාර්තා, නිවේදන සහ මැ.ප්‍ර. නි. ම සිදුවීම් ගූගල් සිතියම අන්තර්ජාලයේ http://cmev.wordpress.com. ට පිවිසීමෙන් ලබා ගත හැක.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සන්ධානය විසින් මැතිවරණයට අදාළ ප්‍රචණ්ඩ සිදුවීම් නිරීක්ෂණය කිරීම සඳහා වන ස්වාධීන සහ අපක්ෂපාතී සංවිධානයක් ලෙස 1997 දී මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවන ලදි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ ඉන්ෆෝම් මානව හිමිකම් වාර්තාකිරීමේ මධ්‍යස්ථානය යන ආයතන වලින් වත්මන් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා මධ්‍යස්ථානය සමන්විත වෙයි.

**වාර්තා වූ සිදුවීම් සමහරක්**

**උතුරු පළාත, නො. 50, කොක්කුපඩ්ඩායම් රෝමානු කතෝලික දෙමළ මිශ්‍ර පාසල සිලාවතුර ඡන්ද මධ්‍යස්ථානය, මන්නාරම මැතිවරණ කොට්ඨාශය, මන්නාරම දිස්ත්‍රික්කය**

මැ. ප්‍ර. නි. ම ජංගම නිරීක්ෂකයෙකු වාර්තා කරන ආකාරයට අංක 01 යටතේ අපේ ජාතික පෙරමුණ පක්ෂයෙන් මන්නාරම දිස්ත්‍රික්කයට තරඟ කරන අබ්දුල් සලාම් මොහොමඩ් හිල්මි අපේක්ෂකයාට පෙරවරු 10. 30 ට පමණ කොක්කුපඩ්ඩායම් රෝමානු කතෝලික දෙමළ මිශ්‍ර පාසලේ පවත්වාගෙන යන අංක 50 ඡන්ද මධ්‍යස්ථානයේ ගේට්ටුව අසලදී රිෂාද් බතියුදීන් අමාත්‍යවරයාගේ ශරීර ආරක්ෂකයන් විසින් පහර දී ඇත. පහර කෑ පුද්ගලයා පෙරවරු 11.05 ට සිලාවතුර පොලිස් ස්ථානයේ මේ පිළිබඳ පැමිණිල්ලක් දමා ඇත ( CIB-104-84 ) එම පොලිස් ස්ථානයේ ඕ අයි සී වරයා මේ සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වමින් සිටියි. පහර කෑ පුද්ගලයා ප්‍රතිකාර සඳහා පේසාලෙයි රෝහලට රැගෙන යන ලදි.

**<u>තර්ජන සහ බියවැද්දවීම්</u>**

**අංක 9, සින්නපූවරසන්කුලම් රජයේ දෙමළ මිශ්‍ර පාසල ඡන්ද මධ්‍යස්ථානය, වවුනියාව දිස්ත්‍රික්කය, වවුනියාව ඡන්ද කොට්ඨාශය**

වව්නියාව දිස්ත්‍රික්කයේ සින්නපූවරසන්කුලම් රජයේ දෙමළ මිශ්‍ර පාසලේ පවත්වාගෙන යන අංක 9 ඡන්ද මධ්‍යස්ථානය ඉදිරිපිට ලියාපදිංචි අංක NP HS 7187 දරණ යතුරු පැදිය බොහෝ වේලාවක් නවත්වා තිබී ඇත. තමන් ඡන්දය දැමීමට මධ්‍යස්ථානය ඇතුළට ගිය නමුත් ඒ පුද්ගලයන් දෙදෙනා හමුදා නිලධාරීන් බව හඳුනාගත් පසු ඡන්දය නොදමා ආපසු හැරී ආ බව ඡන්ද මධ්‍යස්ථානයේ සිටි තරුණයින් පිරිසක් එතැන සිටි මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයෙකුට පවසා ඇත. ඒ පුද්ගලයන් දෙදෙනා පැය දෙකකට වැඩි කාලයක් එතැන රැඳී සිටි බවත් ඡන්දය දැමීමට පැමිණි බොහෝ දෙනෙක් ඡන්දය නොදමා හැරී ගිය බවත් ඒ තරුණයෝ කියා සිටියහ.

**අංක 42, තම්පඩ්ඩි රජයේ දෙමළ මිශ්‍ර පාසල ඡන්ද මධ්‍යස්ථානය, යාපනය දිස්ත්‍රික්කය, කයිට්ස් ඡන්ද කොට්ඨාශය**

තම්පඩ්ඩි ගමේ වැසියන්ගෙන් පෙරවරු 10.05 ට පමණ මැ. ප්‍ර. නි. ම ට ලැබුණු පැමිණිල්ලකට අනුව, පිටස්තර පුද්ගලයන් පිරිසක් සමග ගමට පැමිණි ප්‍රාදේශීය සභා සභාපති ඩැනියෙල් රෙක්සියන් (රාජිප) ඡන්ද මධ්‍යස්ථානය අසලදී වැසියන්ට තර්ජනය කරන්නට පටන් ගෙන ඇත. මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයන් අංක 42 තම්පඩ්ඩි රජයේ දෙමළ මිශ්‍ර පාසල ඡන්ද මධ්‍යස්ථානයේ පෙරවරු 9.30 සිට 10 වනතුරු රැඳී සිට ඇත. මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයන් ඡන්ද මධ්‍යස්ථානයේ සිටින තාක් තත්ත්වය සාමාන්‍ය පරිදි තිබූ නමුත් ඔවුන් එතැනින් පිටත්වූ වහාම මේ සිදුවීම සිදු වී ඇත.

මැ . ප්‍ර. නි. ම ට ලැබුණු වාර්තා අනුව මේ කණ්ඩායම සැප්තැම්බර් 19 වනදා සහ 20 වනදා ඡන්දය නොදෙන ලෙසත් ගමේ අනිත් වැසියන්ටත් ඡන්දය නොදන්නැයි අවවාද කරන ලෙසත් කියා ප්‍රජා නායකයන්ට, ආගමික නායකයන්ට සහ අනිකුත් ප්‍රජා සාමාජිකයන්ට තර්ජනය කර ඇත. ප්‍රාදේශීය සභා සභාපති, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ඩැනියල් රෙක්සියන් තමන්ට පෞද්ගලිකව තර්ජනය කළ බව පුද්ගලයෝ මැ. ප්‍ර. නි. ම ට පැමිණිලි කළහ. ලියාපදිංචි අංක NP-VK 9353 දරණ යතුරු පැදිය තම්පඩ්ඩි ගම පුරා එහාට මෙහාට යනවා තමන් දුටු බව ගම්වැසියෝ වාර්තා කළහ.

පෙරවරු 10 වන විටත් තම්පඩ්ඩි ගමේ 758 වන මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාවෙන් ඡන්දය ප්‍රකාශ කර තිබුණේ 70 දෙදෙනෙකු පමණි.

**අංක 4, 5, 6, 7 ඡන්ද මධයස්ථාන, යාපනය දිස්ත්‍රික්කය, වඩ්ඩුකෝඩෙයි ඡන්ද කොට්ඨාශය**

කරෙයිනගර් වැසියන් වාර්තා කරන ආකාරයට උදේ 7. 15 සිට යාපනය දිස්ත්‍රික්කයේ අංක 4 යා/කරෙයිනගර් යාල්ටන් කොලෙජ් (ශාලා අංක 1), අංක 5 යා/කරෙයිනගර් යාල්ටන් කොලෙජ් (කණිෂ්ඨ අංශය- ශාලා අංක 2), අංක 6 යා/ කරෙයිනගර් යාල්ටන් කොලෙජ් (ශාලා අංක 2) සහ අංක 7 යා/ කරෙයිනගර් යාල්ටන් කොලෙජ් (ශාලා අංක 3) යන ඡන්ද මධ්‍යස්ථාන අසල රැක සිටි හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් විය යුතුයැයි සැක කළ හැකි සරං ඇඳගත් පුද්ගලයන් මිනිසුන්ට ඡන්ද මධ්‍යස්ථානයට ඇතුල් වීමට ඉඩ නොදෙමින් බාධා කර ඇත.

**ඡන්දයට ආදාළ අනෙක් වැරදි ක්‍රියා**

**අංක 16, උදයාර්කඩ්ඩු මහා විද්‍යාලයම් ඡන්ද මධ්‍යස්ථානය, මුලතිවු දිස්ත්‍රික්කය, මුලතිවු ඡන්ද කොට්ඨාශය**

මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයෙකු වාර්තා කරන ආකාරයට අංක 8 ස්ටිකර් ඇලවූ ජගුවර් රථයක් (ලියාපදිංචි අංක 301- 2996) සහ හයි ඒස් වෑන් රථයක් (ලියාපදිංචි අංක 59- 1143) අංක 16 උදයාර්කඩ්ඩු මහා විද්‍යාලය ඡන්ද මධ්‍යස්ථානය ඉදිරිපිට නවතා තිබී ඇත. අංක 8 යටතේ තරග කරන මුලතිවු දිස්ත්‍රික්කයේ එ.ජ.නි.ස යේ අපේක්ෂක ශ්‍රීස්කන්දරාජා අරුල් ජෙනිපොඳ් ගේ ආධාරකරුවන් අංක 8 ඉදිරියේ කතිරය ගැසූ කාඩ් පත් එළිපිටම බෙදා හැර ඇත. මේ සිදුවීම සිදු වී ඇත්තේ උදේ 11. 00 ට පමණ පොලිසිය බලා සිටිද්දීමය.

**අංක 22 ඔඩ්ඩුසුඩාන් හින්දු දෙමළ මිශ්‍ර පාසල ඡන්ද මධ්‍යස්ථානය, මුලතිවු දිස්ත්‍රික්කය, මුලතිවු ඡන්ද කොට්ඨාශය**

උදේ 11 ට පමණ පෙරියසාලාකුලම් ප්‍රදේශයේ සිට අංක 22 ඔඩ්ඩුසුඩාන් හින්දු දෙමළ මිශ්‍ර විද්‍යාලයේ ඡන්ද මධ්‍යස්ථානයට (ඡන්ද මධ්‍යස්ථානයේ සිට කිලෝමීටර් 3 ක් දුර සිට) නොනිල ආකාරයට ඡන්ද දායකයන්ව ප්‍රවාහනය කරන ආකරය මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයන් නිරීක්ෂණය කළහ. මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයන් ඒ බස් රථය නවතා තිබූ ස්ථානයේ තිබී අංත 3 යටතේ තරග කරන එ. ජ.නි.ස මුලතිවු දිස්ත්‍රික් අපේක්ෂක ඒ. සිවලිංගම් ෂතිෂ්කුමාර් ගේ අංකය සහිත කාඩ්පත් අහුලා ගෙන ඇත.

**අංක 8, මල්ලාවි මධ්‍ය මහා විද්‍යාලය ඡන්ද මධ්‍යස්ථානය, මුලතිවු දිස්ත්‍රික්කය, මුලතිවු ඡන්ද කොට්ටාශය**

මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයෙකු උදේ 11.05 ට වාර්තා කළ ආකාරයට හිටපු එල් ටී ටී ඊ සටන් කරුවන් සැක පිට රඳවාගෙන සිටින පුනරුත්ථාපන කඳවුරුවල රැඳවියන් මල්ලාවි මධ්‍ය මහා විද්‍යාලය අසල රැස් වී එ. ජ.නි. ස ට ඡන්දය දෙන්නැයි කියමින් ප්‍රචාරණ කටයුතු වල නිරත වී ඇත.

**අංක 15, 16, 17, 18 ඡන්ද මධ්‍යස්ථාන, යාපනය දිස්ත්‍රික්කය, උඩුපිඩ්ඩි ඡන්ද කොට්ටාශය**

උදේ 11. 45 ට පමණ මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයෙකු වාර්තා කළ ආකාරයට අංක 15 සහ 16 යා/වලයිසිවකුරු විද්‍යාලය ශාලා අංක 1 සහ 2, අංක 17 සහ 18 වලයි බාලිකා මහා විද්‍යාලය ශාලා අංක 1 සහ 2 සහ අංක 19 වලයි ඇමරිකන් මිෂන් දෙමළ පාසල යන ඡන්ද මධ්‍යස්ථානවලට පැමිණි ඡන්ද දායකයන්ට ටී එන් ඒ ආධාරකරුවන් විසින් අරක්කු සහ සිගරට් බෙදා දී ඇත.

**අංක 8. මන්නාරම කරිසල් රෝමානු කතෝලික දෙමළ මිශ්‍ර පාසල ඡන්ද මධ්‍යස්ථානය, මන්නාරම දිස්ත්‍රික්කය, මන්නාරම ඡන්ද කොට්ටාශය**

මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයෙකු වාර්තා කරන ආකාරයට මන්නාරම කරිසල් රෝමානු කතෝලික දෙමල මිශ්‍ර පාසල ඡන්ද මධ්‍යස්ථානය අසල පිහිටා ඇති කරිසල් මුස්ලිම් පල්ලිය කිට්ටුවදී එ. ජ. නි ස යේ ආධාරකරුවන් ප්‍රදේශයේ වැසියන් අතර හරක් මස් සහ ආහාර ද්‍රව්‍ය බෙදා දී ඇත. එසේම බුලත් කොලයට (එ. ජ.නි.ස යේ සලකුණ) ඡන්දය දීමේ වැදගත් කම අවධාරණය කරන නිවේදනයක් ලවුඩ්ස්පීකර් මගින් ප්‍රචාරය කර ඇත.

**අංක 9, මන්නාරම පුදුකුඩිඉරිප්පු රජයේ මුස්ලිම් මිශ්‍ර පාසල ඡන්ද මධ්‍යස්ථානය, මන්නාරම දිස්ත්‍රික්කය, මන්නාරම ඡන්ද කොට්ටාශය**

මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයෙකු වාර්තා කරන ආකාරයට උදේ 6 සිට එ. ජ. නි. සයේ ආධාරකරුවන් මන්නාරම පුදුකුඩිඉරිප්පු රජයේ මුස්ලිම් මිශ්‍ර පාසලට ඡන්දය දැමීමට පැමිණීමට නියමිත ප්‍රදේශවාසීන් අතර වියළි ආහාර බෙදා දී ඇත. ආහාර බෙදා දෙන අතර තුරදී බුලත් කොළයට (එ. ජ.නි.ස යේ සලකුණ) ඡන්දය ලබා දෙන්නැයි මිනිසුන්ගෙන් ඉල්ලා ඇත.

**අංක 47, මන්නාරම/අරිප්පු ආර්. සී. ටී. එම්. එස් ඡන්ද මධ්‍යස්ථානය, මන්නාරම දිස්ත්‍රික්කය, මන්නාරම ඡන්ද කොට්ටාශය**

උදේ 8.10 ට පමණ 50 කගෙන් පමණ සමන්විත වූ පිරිසක් මන්නාරම /අරිප්පු ආර්. සී. ටී. එම්. එස් පාසලේ (අංක 47 ඡන්ද මධ්‍යස්ථානය) ගේට්ටුව අසල රැස් වී ඇත. මැතිවරණ කොමසාරිස්වරයාගේ අනුමැතිය ලත් පුද්ගලයන් සහ ඡන්ද දායකයන් හැරුණු විට ඡන්ද මධ්‍යස්ථානයකට මීටර් 500 ඇතුළත දුරක පිරිස් රැස්වීම මැතිවරණයට ආදාළ වරදකි. මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයන් වාර්තා කළ ආකරයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයට පොලීසිය පැමිණ පිරිස විසුරුවා හැර ඇත.

මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයෙකු නිරීක්ෂණය කළ ආකාරයට ''දෙමළ ජනයාගේ කැමැත්ත දෙමළ ජනතා සන්ධානයට'' යැයි කියවෙන පෝස්ටර් අරිප්පු උප තැපැල් කාර්යාලයේ අලවා තිබී ඇත. ඡන්ද මධ්‍යස්ථානය අසල තාප්පවල ''දෙමළ ජනතාවෙනි අවදිවන්න'' යැයි කියවෙන පෝස්ටර් අලවා තිබෙනු දක්නට ලැබුණි. තැපැල් කාර්යාලට යාබද බෙදුම් තාප්පයක ටී. එන්. ඒ අපේක්ෂකයන් වන අංක 5න් තරග කරන ක්‍රිස්තොක්‍රම් විමලසේගරම් සහ අංක 1 න් තරග කරන ඇන්තනි සූසයිරත්නම් ප්‍රෙමුස් සිරයිවා යන අයගේ පෝස්ටර් අලවා තිබූ බව මැ. ප්‍ර. නි. ම යේ නිරීක්ෂකයෙක් නිරීක්ෂණය කළේය.

**අංක 31, මු/කිරිඉබ්බන්වැව විද්‍යාලයම් ඡන්ද මධ්‍යස්ථානය, මුලතිවු දිස්ත්‍රික්කය, මුලතිවු මැතිවරණ කොට්ටාශය**

පෙරවරු 9. 20 ට පමණ ලියාපදිංචි අංක 56 - 0694 දරණ වෑන් රථයක් මගින් ඡන්ද මධ්‍යස්ථානය වෙත පුද්ගලයන් ප්‍රවාහනය කරමින් තිබෙනු මැ.ප්‍ර. නි. ම නිරීක්ෂකයෙකු හට දක්නට ලැබිණි. ඡන්ද මධ්‍යස්ථානයට මීටර් 200 ක් පමණ ඈතින් පුද්ගලයන් සිය දෙනෙකු පමණ රැස්වී සිටීම හා මෝටර් සයිකල් 15 ක් පමණ හා වෙනත් වාහනද එම ස්ථානය අවට නවත්වා තිබීමද ඔහුගේ නිරීක්ෂණයට ලක්විය. ඡන්ද මධ්‍යස්ථානයට මීටර් 200ක් පමණ ඈතින් පිහිටි නිවසක ඩෙස්ක් එකක් තබා ගෙන යම් පුද්ගලයෙකු ලැයිස්තුවක් පිළියෙළ කිරීමක් වැනි කාර්යයක නියැලී සිටිනුද දක්නට ලැබුණි.

**අංක 33, මව්/මාවිලන්කේනි ආර්.සී. ටී. එම්. එස් මුරුගන් ඡන්ද මධ්‍යස්ථානය, මන්නාරම දිස්ත්‍රික්කය, මන්නාරම ඡන්ද කොට්ඨාශය**

56-3493 ලියාපදිංචි අංකය දරණ වෑන් රථය මගින් අංක 33 දරණ මාවිලන්කේනි ආර්. සී. ටී. එම්. එස් මුරුගන් ඡන්ද මධ්‍යස්ථානය වෙත ඡන්ද දායකයන් ප්‍රවාහනය කිරීම මැ.ප්‍ර.නි.ම නිරීක්ෂකයන්ගේ නිරීක්ෂණයට ලක් විය. මන්නාරම දිස්ත්‍රික්කයේ එ.ජ.නි.ස අපේක්ෂක අංක 4 දරණ අබ්බාස් අබ්දුල් රිෆ්කාන් මහතාගේ පෝස්ටර් වෑන් රථයේ අලවා තිබෙනු දක්නට ලැබුණි.

**අංක 4 නඩකන්ඩාල් රජයේ දෙමළ මිශ්‍ර විද්‍යාලය ඡන්ද මධ්‍යස්ථානය, මුලතිවු දිස්ත්‍රික්කය, මුලතිවු මැතිවරණ කොට්ඨාශය**

නඩකන්ඩාල් රජයේ දෙමළ මිශ්‍ර පාසලේ සිට කිලෝමීටර් 3 ක දුර ප්‍රමාණය අතර පුද්ගලික බස් රථ දෙකක් ධාවනය කෙරෙනු මැ. ප්‍ර. නි. ම නිරීක්ෂකයෙකු හට දක්නට ලැබී වාර්තා කරනු ලැබීය. මැතිවරණ කොමසාරිස්වරයා විසින් පොරොන්දු වූ පරිදි මූන්ට්‍රම්පුරිප්පු (කිලෝමීටර් 10 ක් දුරින් පිහිටි) සිට ඡන්ද දායකයන් ප්‍රවාහනය කළ කිසිදු බස් රථයක් නොවූ බව මැ. ප්‍ර. නි. ම නිරීක්ෂකයා විසින් වාර්තා කරන ලදි. බස් සේවාවක් නොපැවති හෙයින් ඡන්දය දැමීමට පැමිණියේ ඉතා සුළු ඡන්ද දායකයන් පිරිසකි. මූන්ට්‍රම්පුරිප්පු හි ලියාපදිංචි ඡන්ද දායකයන් 548 දෙනෙකු සිටින අතර මැ. ප්‍ර. නි. ම නිරීක්ෂකයාට අනුව මධ්‍යාහ්න 12 වන විට ඡන්දය පාවිච්චි කර තිබුණේ ඔවුන් අතරින් සියයට 10 ක් පමණකි.

**<u>පූර්ව මැතිවරණ සිදුවීම්</u>**

**<u>කිලිනොච්චි දිස්ත්‍රික්කය, කිලිනොච්චි මැතිවරණ කොට්ඨාශය/ කිලිනොච්චි නගරය. ද්‍රවිඩ ජාතික සන්ධානයේ ප්‍රධාන සංවිධායක ශ්‍රීධරන් මහතාගේ පක්ෂ කාර්යාලය</u>**

සැප්තැම්බර් 20 වන දින පස්වරු 10. 30 ට පමණ කිලිනොච්චි මැතිවරණ කොට්ඨාශයේ ද්‍රවිඩ ජාතික සන්ධානයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී ශ්‍රීධරන් මහතාගේ පක්ෂ කාර්යාලය නාඳුනන පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් විසින් වටලනු ලැබූ අතර ඔවුන් අතර නිල ඇඳුමින් සැරසුණු පොලිස් භටයන්ද සිටි බව මැ. ප්‍ර. නි.ම යට වාර්තා විය. පක්ෂ කාර්යාලය තුළ සිටි පුද්ගලයන්ට හිරිහැර සිදුවන ආකාරයට ඔවුන් එහි දීර්ඝ වේලාවක් රැඳී සිටි බව වාර්තා වේ. ද්‍රවිඩ ජාතික සන්ධාන ආධාරකරුවන් 15 දෙනෙකු පමණ එම අවස්ථාවේ කාර්යාලය තුළ සිට ඇත. 119 ඔස්සේ පොලිස් හදිසි ඇමතුම් සේවයට මෙම සිද්ධිය දැනුම් දෙනු ලැබූ බව වාර්තා වන නමුත් මෙම තත්ත්වය පාලනය කිරීම පිණිස කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැත. පස්වරු 11. 15 ට පමණ මැ. ප්‍ර. නි. ම ජංගම නිරීක්ෂක කණ්ඩායමක් මෙම ස්ථානයට පැමිණ ඇති අතර ඉන් පසු එම නාඳුනන කණ්ඩායම විසිර ගොස් ඇත. ශ්‍රීධරන් මහතා සමග කළ සම්මුඛ සාකච්ඡාවකදී ඔහු පැවසුවේ මෙම සැක කටයුතු පිරිස හමුදාවට සම්බන්ධ බුද්ධි අංශ පිරිස් වන බවයි.

| | | |
|---|---|---|
| ආචාර්ය පී. සරවනමුත්තු | සුනිල් ජයසේකර | උදය කළුපතිරණ |
| සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු | සම කැඳවුම්කරු |